කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015

2020 පෙබරවාරි - අප්‍රේල්

මානවශාස්ත්‍ර පීඨය

සිංහල

නූතන සිංහල සාහිත්‍ය ප්‍රවේශය SINH E - 1015

පළමුවන කොටසේ ප්‍රශ්නයක් ,දෙවන හා තුන්වන කොටස්වලින් ප්‍රශ්න දෙක (02)

බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

## I කොටස

① පහත සඳහන් කවි පෙළ පිළිබඳ විචාරයක් කරන්න.

සෙවණැලි අවදි නොමවන වැව් ඉවුරු කොණේ
කාලය විසින් හැරුව නුග ගසක බෙණේ
මල කා කළුව ගිය ආයුද කැබලි පෙනේ
දෙවියෙක් නැත ද මෙහි බලයක් තිබෙනු දැනේ

බුද ගුරු සනි හිරුට හිමි හැම දවස් වල
මේ සන්හිඳේ එළියක් ඇත සවස් කල
ලෙඩ දුක් වලින් මිදුමට බාරයක් කළ
හැම දෙන එතැන රැස්වෙති ගම ගෙවල් වල

වන පෙත දැවෙන විට වැද මළ හිරුගෙ රත
ගනඳුර වසන විට ආලෝකයෙහි නෙත
සඳරැස් ගලන විට තෙරපී සෙවන මත
එක දෙවියෙක් නොවේ දාහක් එතැන ඇත

දෙව් දේවතාවුන් සැරිසරන මහ වනේ
පවතින බලය ඇඟ ලොම් තුඩකටද දැනේ
මොළයෙන් තමා ලෝකයෙ සුවය වැනසුනේ
මගෙ ගැරහුමට නැත ඒ පිරිස යොමුවුනේ

සංහිඳ ළඟ බාරයට කිරි ඉතිරීම
කෙම්මුර දවස්වල පානින් සැරසීම
වන අතු කඩා ගස් දෙබලක දැවටීම
මා නොකෙරුවත් නොකෙළෙමි එය ගැරහීම

සාගත වසංගත හා එන නියඟ වලින්
සහනය පතා වන දෙවියන් ළඟට කෙළින්
එන මේ පිරිස සැරසීමට නුවණ "මලින්"
පෙළඹෙන අයට අනුකම්පා කරමි මුලින්

ගංගොඩ වටා මෝරන වන ලැහැබ මැන
අහුමුලු නැර සිය අණසක පතුරු වන
බලවත් අයියනායක දෙන ගොදුරු ගෙන
මේ අය රකිනු මැන යන එන සියලු තැන

මාපිල් පිඹුරු නා පොළඟුන් සිටින තැන
අලි කොටි වලස් මුළු කොලහල කරන තැන
නිතරම ඔබ පුදන මේ අය ඇඳින ගෙන
බලවත් දෙවිතුමනි දිව රෑ රකිනු මැන

## II කොටස

② කෙටිකතාව නවකතාවෙන් වෙනස් වන ආකාරය නිදසුන් ආශ්‍රයෙන් පරීක්ෂා කරන්න.

③ පහත සඳහන් කෙටිකතා අතරින් එකක් පිළිබඳ විචාරයක් කරන්න.

- I වහල්ලු
- II මැයි දිනය
- III වතුර ටැංකිය යට හෙවන
- IV තුඹස් මාළිගා

④ "නවකතාකරුවාගේ කාර්ය වන්නේ චරිත, අවස්ථා හා සිද්ධි අනුසාරයෙන් ජීවිතය නිරීක්ෂණය කිරීමයි." නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න

⑤ "චරිත තුනක් නවකතාව මගින් සාම්ප්‍රදායික ගැමි ජන ජීවිතය හා එය අභිබවා නැඟී සිටින ග්‍රාමීය මධ්‍යම පාන්තික ජන ජීවිතය නිරූපණය වෙයි." විමසන්න.

## III කොටස

⑥ කොළඹ යුගයේ වැඩිහිටි කවීන්ගේ පද්‍ය නිර්මාණයන්හි දැකිය හැකි විශේෂතා සනිදර්ශනව සාකච්ඡා කරන්න.

⑦ මධ්‍යම පාන්තික ජන ජීවිතය හා සම්බන්ධ විවිධ විෂයක අත්දැකීම් නිරූපණයෙහි ලා 70 දශකයේ කවීන් පළ කළ කුසලතා නිදසුන් ඇසුරෙන් පරීක්ෂා කරන්න.

⑧ " නාට්‍ය වනාහී සජීවී කලා මාධ්‍යයකි." විමසන්න.

⑨ පුද්ගල සංකීර්ණතා ප්‍රකට වන අයුරින් චරිත නිරූපණයෙහි ලා එදිරිවීර සරච්චන්ද්‍ර පළ කළ කුසලතා මනමේ නාට්‍ය ඇසුරෙන් විමසන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගින් ප්‍රදානය කෙරේ.)

*************************